සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය

**සති පාසල 24**

<u>තොරතුරු පත්‍රිකාව</u>

***කදා වළලු නාට්‍ය - 3 වන කොටස***

**කදා වළලු නාට්‍ය හා සේරිවාණිජජ ජාතක කතාව අතර ඇති වෙනස හඳුනා ගනිමු.**



සේරිවාණිජ ජාතක කතාව

"බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩවසන් සමයේ පසුබට වූ වීර්යය ඇති භික්ෂුවක් උදෙසා සේරිවාණිජ ජාතකය දේශනා කොට ඇත. එක්තරා භවයක සේරිව රාජ්‍යයෙහි වෙළෙඳ කුලයක උපන් බෝසතුන් කච්ඡපුට යැයි නම් ඇති ව සේරිවාණිජ නම් වෙළෙඳකු සමඟ අන්ධපුරයේ

දෙමහකින් ගොස් බඩු විකුණන අතරතුර සේරිවාණිජ එක් දුප්පත් සිටු දියණී කෙනෙකුට කදා වළලු විකිණීමට ගත් උත්සාහයේ දී උප්පත්කම නිසා මුදල් නැති බැවින් තම පරපුරේ පළමු මහ සිටාණෝ දන් වළඳා ඉවත් කොට මලගැසී ගිය රන්තලිය දී වළලු ගැනීමට තැත් කළ අවස්ථාවේ එය සනරන් බව දැන නොවටිනා බව කියමින් ඉයතට වීසි කොට උපායකින් එය හැරගනිමි යි සිතා ඉවත්ව ගිය අතරේ එම සිටු මාළිගයට පැමිණ බෝසත් කච්ඡපුට වෙළෙන්දා එම රන්තලියට තමා සතු සියලු කහවණු හා භාණ්ඩ ද දී එය රැගෙන ගියේ ය. නැවත ආපසු පැමිණි සේරි වෙළෙන්දා සිදු වූ දේ දැන ඔරුවෙන් ගඟෙන් එගොඩ වෙමින් සිටි කච්ඡපුට වෙළෙඳාට සාප කරමින් ළය පැලී ද්වේෂ සහගත ව මිය ගියේ ය. එතැන් පටන් සසරේ විවිධ භවවල දී රැගෙන ආ වෛරය සිද්ධාර්ථ ගෞතම බුදුන් සමය තෙක් රැගෙන ආ අයුරු ජාතක කථාව සංක්ෂිප්ත ව දක්වයි.

- සේරිවාණිජ ජාතකයේ එන කථා වස්තුව සම්පූර්ණයෙන් ම මුල මැද අග සහිතව සිදුවීම් පෙළක් සේ රචනා වී තිබීම.
- එහෙත් ජාතක කථාවේ දැක්වෙන සියලු ම සියුම් තැන් නාට්‍යය පෙළට ඇතුළත් කළ නොහැකි බව.
- ජාතක කතා සාහිත්‍යය මඟින් මෙන් ම නාට්‍යයෙන් ද පෙන්වා දෙන ආකාරය.
- කච්ඡපුට වෙළෙන්දාගේ මානව හිතවාදී ගුණයත් අවංකභාවයත් ජාතක කථාව මඟින් මෙන් ම නාට්‍යයෙන් ද මනාව පිළිබිඹු වීම.
- සේරිවානිජ වෙළෙන්දා රන්තලිය වංචාවෙන් ලබාගැනීමට උත්සාහ දැරීමේ දී උත්තම වූ බෝධිසත්ත්ව ගුණාංගයන් ගෙන් පරිපූර්ණ කච්ඡපුට වෙළෙන්දා දුක්පත් සිටු දියණියටත් සිටු පවුලේ මිත්තණියටත් සාධාරණය ඉටු කරන අයුරු.
- නාට්‍යයෙන් මෙන් ම ජාතක කථාවෙන් ද අවංකත්වයේ උත්තම ස්වභාවයත් වංක බව, මුසාවාදය, දැඩි මසුරුකම ආදී දුර්ගුණයන්හි අධම බවත් ඉස්මතු වීම.
- සාහිත්‍යකරුවා සිය ගද්‍ය සාහිත්‍යය එනම් ජාතක කථා, දෘෂ්‍ය කාව්‍ය (නාට්‍ය) මඟින් සමාජයේ පැවැත්ම උදෙසා වටිනා තේමාවක් ඉස්මතු වන අයුරින් සිය නිර්මාණ දායකත්වය සමාජයට දායාද කරන ආකාරය එමඟින් මැනැවින් පිළබිඹු වීම.

## ජාතක කතාවෙන් ගතහැකි ආදර්ශ / තේමා

- සියල්ලෙන් නොපසුබට වීර්යයෙන් කටයුතු කළ යුතු වීම.
- අප්‍රමාද ව කටයුතු කිරීමෙන් ජීවිතයේ අභියෝග ජයගත හැකිය.
- වඩාත් අවංකව කටයුතු කිරීමෙන් විවිධ ප්‍රතිලාභ අත්වන බව.
- ධනය හා බලය අහිමි වූ විට සිටුවරුනට පවා අනුනට අත පා ජීවත් වීමට සිදු වේ.
- අධික තෘෂ්ණාව විනාශයට හේතු වේ.
- අනුන් රැවටීමට උත්සාහ ගැනීමෙන් තමා ද රැවටීමට ලක් වේ.
- තැනට සුදුසු නුවණින් ක්‍රියා නොකළ විට පසුතැවීමට සිදු වේ.
- වෛරයෙන් වෛරය නොසංසිඳේ.

ප්‍රඥාවන්තයන්ගේ උපදෙස් අනුව එනම් අධික තෘෂ්ණාවෙන් කටයුතු කිරීමත් ස්ථානෝචිත ප්‍රඥාව නොමැති වීමත් පුද්ගල විනාශයට හේතුවක් වේ.

## -පැවරුම-

1. සේරිවාණිජ ජාතක කතාවේ ඇතුළත් එහෙත් කදා වළලු නාට්‍යයේ ඇතුළත් නොවන අවස්ථා හා සිද්ධි පෙළගස්වන්න.
2. ජාතක කතාවේත් කදා වළලු නාට්යයේත් කථා වස්තු සාරංශගත කොට ලියා දක්වන්න.
3. ජාතක කතාවෙන් ගත හැකි ආදර්ශ ලියා දක්වන්න.